<u>1 පාඩම බුදු සිරිත අනුව යමු අභියෝග ජය ගනිමු</u>

✱ බුදුන් වහන්සේගේ උදාන ප්‍රකාශය

අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවේසන්තෝ - දුක්ඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨෝසි - පුන ගේහං නකාහසි
සබ්බාතේ ඵාසුකා භග්ගා - ගහකූටං විසංඛිතං
විසංඛාර ගතං චිත්තං - තණ්හානං ඛය මජ්ඣගාසි

සංසාරයේ නැවත ඉපදීම දුකකි. පංචස්කන්ධය සාදන වඩුවා නොදැකීමෙන් ඔහු සොයමින් සසර සැරිසැරුවෙමි.
තණ්හාව නමැති වඩුවා මම තා දුටිමි තොපේ මේ ගෙය නැවත නොසාදන්නෙහිය. තාගේ ගෙයි කෙලෙස් නමැති පරාලය සහ අවිද්‍යාව නමැති කැණිමඩල කඩා විසුරුවෙමි. මගේ සිත නිවනට පත් විය. තණ්හාව සහමුලින්ම ක්ෂය විය

✱ බුදුරදුන් අභියෝගයන්ට මුහුණ දුන් අවස්ථා

- තණ්හා රති රගා යන මාර දූවරුන් ගේ රංගනයන් ඉදිරියේ ඒ නොසැලී සිටීම
- ඝෝෂිතාරාමයේ ඇතිවූ ධර්මධර විනයධර ගැටළුවේ දී බුදුරදුන් පාරිලෙය්‍ය වනයට වැඩම කොට කටයුතු කිරීම
- දොලොස්වන වස් කාලය ගත කිරීමේ දී වේරංජාවේ ඇතිවූ දුර්භික්ෂයට මුහුණදී වස්කාලය අතනොහැර අවසන් කිරීම
- විශාඛාව අනේපිඩු වැනි අය කෝටි ගණන් වටිනා ආරාම සාදවා පූජා කළ ද එහි ඇල්මකින් තොරව පරිහරණය කරමින් අරිය දිවියක් ගත කිරීම

<u>2 පාඩම බුදුගුණ අනන්තය</u>

✱ ගිලනුන්ට උපස්ථාන කිරීම

- කායික මානසික රෝගයන්ට පිහිටවීම
- බුදුරදුන් විහාර චාරිකාවේ යෙදෙන අවස්ථාවේ රෝගීව සිටි පූතිගත්තතිස්ස හිමියන්ට පිහිටවීම
- උදරාබාධයකින් පෙළුණ භික්ෂූන් වහන්සේ නමකට පිහිටවීම
- පිප්ඵලි ගුහාවට වැඩම කොට රෝගී වූ මහා කාශ්‍යප හිමියන්ට සත්ත බොජ්ඣංගය දේශනා කිරීම
- කලන්දක නිවාපයට වැඩම කොට අසනීපව සිටි මුගලන් හිමියන් සුවපත් කිරීම

''මහණෙනි දැන් මා දැන් ඔබට මා වෙත තැනු පිරිසක් නැත . ඒයින් මෙබදු අවස්ථාවක දී එකිනෙකා ඔවුනොවුන්ට උපකාරීව සහයෝගයෙන් ක්‍රියාකල යුතුය. මාගේ මෙම අවවාදය පිළිපදින තැනැත්තා ගිලනුන්ට උපස්ථාන කරන මට උපස්ථාන කරන්නේ ය.''

- **අසරණ සරණ ගුණය අසරණයින් සොයා ගොස් පිහිටවීම**

- සිබද්ද චාරිකාව
- සොහොන් බිමට ගොස් සෝපාකට පිහිට වීම.
- කසළ පදලා ඇතිව සිටි සුනීතට පිහිටවීම.
- සොරුන් අතින් ගිලිහී තිබූ කහවණු පොදියක් අහුලා ගැනීම, නිසා අනතුරට පත් වීමට ගිය ගොවියකු බේරාගැනීම.
- සත් හැවිරිදි වියේදී යක්ෂයෙකුට බිලිවීමට සිටි ආළවක කුමාරයා සහ දීඝායු කුමාරයා බේරාගැනීම.
- ගෙල වැළලා ගැනීමට ගිය රජ්ජුමාලාට පිහිටවීම.
- මට්ඨකුණ්ඩලී, ජන්තමාණවක, පේසකාර දියණිය, බාහිය දාරුචීරිය ආදීන්ට පිහිටවීම.
- උදේනි රජුගේ භද්දවතිකා ඇතින්නට පිහිට වීම.
- දරුවන්ගේ හිංසාවට ලක්වූ ගැරඩියෙකු බේරා ගැනීම.

- **පුරිසධම්ම සාරථී ගුණය නොහික්මුණ පිරිස හික්මවීමේ ගුණය**

- අංගුලිමාල දමනය කිරීම
- අලව් නුවර ආළවකයාගේ විමානයට වැඩමකොට ආළවක යක්ෂයා දමනය කිරීම
- සුචිලෝම ඛරලෝම වැනි යක්ෂයන් දමනය කිරීම
- නාලාගිරි හස්තියා දමනය කිරීම
- තමා සමග වාද කිරීමට සමතෙක් නොමැයි සිතා සිටි සච්චක නිගණ්ඨ නාට පුත්‍රයා දමනය කිරීම
- නිගණ්ඨනාථපුත්ත ශාස්තෘ වරයාගේ අනුගාමිකයකු වූ උපාලි ගෘහපතියා දමනය කිරීම
- 1000 පිරිසක් සමග සිටි තුන් බෑ ජටිලයන් දමනය කිරීම

ගුරුළුගෝමීන්ගේ අමාවතුරෙහි දක්වා ඇත්තේ

මෙසේ බුදුහු දෙව්රම් වෙහෙර අඹදම් වෙහෙර වස් වසමින් වැඩ වසනුවෝ තුන් ලොවෙහි සැරිසරූ උපාලි ගහපතිහු ඈ සිටිනුදු සුදොවුන් ඈ ඔබුනුදු අජාසත් ඈ රජ් තුදු අඟුලිමල් ඈ සොරුනුදු සභිය ඈ පරිබ්‍රාජකනුදු සච්චක ඈ නිගටනුදු පාථික පුත් ඈ දීඝනඛරයනුදු සච්චබද්ධ පරිලනුදු පකුධ ඈ තවුසනුදු ගොපලුන් ඈ මිනිසුනුදු තන්දුල්පාලද් ඈ ගොහරානනුදු නාලාගිරි ඈ ඇතුනුදු ආළවක ඈ යකුනුදු රාහු ඈ අසුරනුදු සක්දෙව් ඈ දෙවියනුදු බක ඈ බඹුනුදු දමා අමා මහ නිවන් පැමිණ වූහ.

- **තාදී ගුණය - අෂ්ට ලෝක ධර්මතාවය ඉදිරියේ නොසැලී සිටීම (අකම්පෙය ගුණය)**

- **ලාභ** අනේපිඩු විශාකා ආදීන් සුවිසල් වෙහෙර විහාර සාදවා පූජා කිරීම
- කොසොල් රජු අසදෘශ මහා දානය පිදීම

- **අලාභ** දොළොස්වන වස්කාලයේ උදය බමුණාගේ ආරාධනය පිළිගෙන වේරංජාවේ වස් වසා දුර්භික්ෂයට මුහුණ දී යව හැලින් දිවිගෙවීම

- **යස අයස නින්දා** සුන්දරී පරිබ්‍රාජිකාව, චිංචිමානවිකාව, මාගන්දිය, අක්කෝසක භාරද්වාජ, කසීභාරද්වාජ ආදීන්ගේ අපහාසයන් හා අපවාදයන්ට මුහුණදීම
- **ප්‍රශංසා** සෝණදණ්ඩ, වංකී වැනි බමුණන් හා පොට්ඨපාද වැනි පිරිවැජියන් බුදුරදුන්ගේ ගුණ වර්ණනා කිරීම

3 පාඩම බුදුකුරු දම් පුරා දිවි මඟ සපුරා ගනිමු

✸ **දස පාරමිතාව -** නිවනට පමුණුවන පිළිවෙත් පාරමිතා වේ.

- දාන පාරමිතාව - වෙස්සන්තර ජාතකය සිවි ජාතකය සස ජාතකය
- ශීල පාරමිතාව - සීල වීමංස ජාතකය
- නෙක්ඛම්ම පාරමිතාව - මඛාදේව ජාතකය
- ප්‍රඥා පාරමිතාව - උම්මග්ග ජාතකය
- විරිය පාරමිතාව - වණ්ණුපථ ජාතකය
- ඛන්ති පාරමිතාව - ක්ෂාන්තිවාදී ජාතකය
- සත්‍ය පාරමිතාව - වට්ටක ජාතකය
- අධිෂ්ඨාන පාරමිතාව - තේමිය ජාතකය
- මෛත්‍රී පාරමිතාව - මහාකපි ජාතකය සහ මඝ මානවක ජාතකය
- උපේක්ඛා පාරමිතාව - ලෝම හංස ජාතකය

දානං සීලංච නෙක්ඛම්ම - පඤ්ඤා විරියෙන පංචමං
ඛන්ති සච්චමධිට්ඨානං - මෙත්තුපෙක්ඛාතිමෙ දස

4 පාඩම සමාධිගත සිතක මහිම

බුදුදහම තුළ සිත සමාධි ගත කිරීමේ මූලික පියවර භාවනාවයි.
බුදුරදුන් දේශනා කරන්නේ දිවා රෑ දෙකෙහිම භාවනාවට යොමු කළ සිත් ඇති බුදු සව්වෝ නිරතුරු ප්‍රබුද්ධ ජීවිතයක් ගතකරන බවයි. භාවනාව තුළින් කුසලය වැඩිදියුණු වේ. එය මානසික අභ්‍යාසයකි.
එනම් කුසලයට අර්ථ තුනකි

- නිරෝගී බව - මානසික නිරෝගීතාවය
- නිවැරදි බව - මානසික නිවැරදි බව
- දක්ෂ බව - මානසික දක්ෂතාවය

බෞද්ධ භාවනා ක්‍රම දෙක

- සමථ භාවනාව චිත්ත භාවනාව
- විපස්සනා භාවනාව

<u>සමථ භාවනාව</u>

සංසිඳුවීම සංවරවීම සමාදාන කරවීම

- **කාමච්ඡන්ද නීවරණය** නම් කම්සැප විඳීමට ඇති කැමැත්ත .
    - ඇසට - රූප කාමයන් ඇතිවේ
    - ශබ්දය - ශබ්ද කාමයන් ඇති වේ
    - නාසය - ගන්ධ කාමයන් ඇතිවේ
    - දිවට - රස කාමයන් ඇතිවේ
    - කයට - ස්පර්ශ කාමයන් ඇතිවේ

සාමඤ්ඤඵල සූත්‍රය ණයගැතියෙකු ණයහිමිට යම් බැඳීමක් ඇති ද එවිට වහලෙකු මෙන් යටත්වන බවයි

කාමච්ඡන්දය එවැනි වේ

- **ව්‍යාපාද නීවරණය** අරමුණ හා ගැටෙන ස්වභාවය
- **ථිනමිද්ධය** සිතේ උදාසීන බව
- **උද්ධච්ච කුක්කුච්ච** සිත නොසන්සුන් බව
- **විචිකිච්චාව** සිතේ අවිශ්වාසය

✱ **පුද්ගල චරිත වර්ග 6**

- රාග චරිත - ආශාව අධික චරිත
- දෝස චරිත - ද්වේෂය අධික චරිත
- මෝහ චරිත - මුලාව මෝඩකම
- සද්ධා චරිත - ශ්‍රද්ධාව මුලික වූ චරිත
- බුද්ධි චරිත - බුද්ධිය මුලිකව කටයුතු කරන චරිත
- විතර්ක චරිත - තර්කානුකුලව විමසුම් සිතකින් කටයුතු කරන චරිත

✱ සමථ භාවනාවේ අරමුණු හතලිහකි
(එය සමසතළිස් කර්මස්ථාන ලෙස හඳුන්වයි)

දස කසිණ	10
දස අසුභ	10
දසඅනුස්සති	10
චතු අප්පමඤ්ඤා	04
ආහාරෙ පටික්කුල සඤ්ඤා	01
චතුධාතු වවත්ථාන	01
සතර ආරුප්ප	04

✱ සමථ භාවනා වැඩීමෙන් ලැබෙන උසස් ම ඵල

- පංච අභිඥා
- අෂ්ට සමාපත්ති

- <u>සමථ භාවනාවෙන් ශිෂ්‍ය ජීවිතයට ගතහැකි ප්‍රයෝජන</u>
  - මතක ශක්තිය දියුණුවීම
  - එක් අරමුණක සිටීමට හැකි වීම
  - ගැටළු විසඳීමේ ශක්තිය දියුණුවීම
  - වහා අවබෝධ කර ගැනීමේ ශක්තිය
  - දියුණුවීම
  - ඉවසීමේ ශක්තිය
  - පිළිවෙලින් යමක් ඉදිරිපත් කිරීමේ හැකියාව

<u>විපස්සනා භාවනාව</u>

විදර්ශනා භාවනාව/ ප්‍රඥා භාවනාව /ත්‍රිලක්ෂණ භාවනාව ආදි ලෙස හඳුන්වයි පංචස්කන්ධය දෙස විශේෂ කොට බැලීමයි (*විවිධාකාරේන පස්සතීති විපස්සනා*)

- රූප - ශරීරය — රූප
- වේදනා - විඳීම /(දුක සැප මධ්‍යස්ථ)
- සඤ්ඤා - හඳුනාගැනීම
- සංඛාර - හඳුනාගෙන රැස් කරන දේ
- විඤ්ඤාණ - සිතා අරමුණු දැනගැනීම

(වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ — නාම)

- <u>විදර්ශනා භාවනාවේ ආනිසංස</u>
- අරමුණු වල සැබෑ තත්ත්වය නුවණින් විමසා බැලීම
- ශරීරය දුක් සහිත බව අස්ථිර බව පිළිකුල් බව අවබෝධ වීම
- නොවෙනස්වන පදාර්ථයක් නොමැති බව දැනගැනීම
- ඊර්ෂ්‍යා ක්‍රෝධය වැනි දුර්ගුණයන් විනාශයට පවතින බව දැනගැනීම

<u>5 පාඩම ආදර්ශවත් චරිත</u>

- <u>අතිපූජ්‍ය ථේරුකානේ චන්ද්‍රවිමල මහා නාහිමි පාණන් වහන්සේ</u>
- උපත - 1897 ජූලි මස 19 දින
- පියා- දොන් බස්තියෙන් ද පවුලිස් ගුණවර්ධන මහතා
- මව - මුණසිංහගේ පොඩිනෝනා
- ගිහි නම - රූබෙල් ගුණවර්ධන
  (සහෝදරයන් හය දෙනකුගෙන් යුත් පවුලේ වැඩිමලාය)
- මූලික අධ්‍යාපනය - විදියගොඩ පාසල
- පැවිදිවීම- 1906 ජනවාරි 8 බුරුම ජාතික විනයාලංකාර හිමියන් අතින් පැවිදි විය
- 1908 ජනවාරි 27 විනයාලංකාර හිමියන් සමඟ බුරුම රටට වැඩම කොට වසර දහයක් එහි අධ්‍යාපනය ලැබූහ
- 1917 ඔක්තෝම්බර් 26 වන දින බුරුමයේ ධම්මිකාරාම සීමාවේදි අධිශීලයට පත්වූහ

- මෙරටට වැඩම කොට දෙමටගොඩ විශුද්ධාරාමයේ වැඩසිටි සිරිධම්ම හිමිගෙන් අභිධර්මය ඉගෙන ගත්හ
- උන්වහන්සේ රචිත ග්‍රන්ථ
    - පොහොය දිනය
    - ධර්ම විනිශ්චය
    - බෞද්ධයාගේ අත්පොත
    - පාරමිතා ප්‍රකරණය
    - අභිධර්ම මාර්ගය
- පිරිවෙන් අධ්‍යාපනය හෝ උපාධි හිමි නොවිය ප්‍රාචීන භාෂෝපකාර සමාගම ''සම්මාන පණ්ඩිත'' උපාධිය පිරි නැමුහ
- විද්‍යාලංකාර පිරිවෙන (කැලණි විශ්වවිද්‍යාලය) අභිධර්මය පිළිබඳ මහාචාර්ය පදවිය පිරිනැම්ම
- 1963 සාහිත්‍ය චක්‍රවර්ති උපාධිය ලැබුහ
- අනුරාධපුර බුද්ධ ශ්‍රාවක විශ්ව විද්‍යාලය ප්‍රවචන විශාරද සම්මාන උපාධිය පිරිනැම්ම
- 1976 දී ශ්‍රී ලංකා ශ්වේජින් නිකායේ මහා නායක පදවිය හිමිවිය
- 1995 දී අමරපුර මහා සංඝ සභාව මගින් අමරපුර ''මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන'' යන ගෞරවනාමය පිදීම
- උන් වහන්සේ ප්‍රකාශ කොට ඇත්තේ *''මම පොත් රචනා කළේ මුදල් ඉපයීමට නොව මගේ පොත් කවුරු හෝ මුද්‍රණය කළා ට මගේ පොත්වල කොටස් උපුටා ගත්තා ට මගේ නම මකලා වෙන කෙනෙකු ගේ නමින් මුද්‍රණය කළා ට මගේ නම් කිසිම විරුද්ධත්වයක් නැහැ ඒක නීති විරෝධී වුණාට මගේ නම් තහනමක් නෑ''*
- 1994 ජූලි 4 අපවත් වූහ

✸ <u>ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා</u>

- උපත - 1864 සැප්තැම්බර් 17 දින
- පියා - දොන් කරෝලිස් හේවාවිතාරණ
- මව - මල්ලිකා ධර්මගුණවර්ධන
- නම - දොන් ඩේවිඩ් හේවාවිතාරණ
- අධ්‍යාපනය
    - 1872 සිට 1874 දක්වා බැප්ටිස්ට් සිංහල පාසලේ ඉගෙනුම ලැබූහ
    - 1874 සිට 1876 දක්වා ශාන්ත බෙනඩික් විද්‍යාලයේ ඉගෙනුම ලැබූහ
    - 1876 සිට 1878 කෝට්ටේ ක්‍රිස්තියානි විද්‍යාලයේ ඉගෙනුම ලැබූහ
    - 1878 සිට 1883 දක්වා ශාන්ත තෝමස් විද්‍යාලයේ ඉගෙනුම ලැබූහ
- 1873 පානදුරාවාදයෙන් පසුව මෙරට පැමිණි කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා හා බ්ලැවට්ස්කි මැතිනිය ආදීන් ගාල්ල මහින්ද පිරිවෙනේදී බුදුදහම වැළඳගෙන පරම විඥානාර්ථ සාමාගම පිහිටුවා සරසවි සඳරැස පුවත්පත ආරම්භ කළහ

- එහි පැවැති ඕල්කට්තුමාගේ දේශන අසා හේවාවිතාරණ අනගාරික ධර්මපාල නමින් බුදු දහම වැළඳගත්හ
- ධර්මපාල තුමා මිෂනාරි අධ්‍යාපනය වෙනුවට බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් ඉරිදා දහම් පාසල් ආරම්භ කළහ
- *"සිංහලයිනි නැගිටිව් බුද්ධගයාව බේරාගනිව්."* යනුවෙන් ප්‍රකාශ කරමින් "මහන්තා" නම් හින්දු පූජකයාගෙන් බුද්ධාගයාව බේරා ගැනීමට කටයුතු කළහ
- එතුමාගේ බෞද්ධ සිද්ධස්ථාන
    - එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය
    - කල්කටාවේ ධර්මරාජික මහා විහාරය
    - බරණැස මූලගන්ධිකුටි මහා විහාරය
    - බුද්ධ ගයාවේ හා මද්‍රාසියේ බෞද්ධ විශ්‍රාම ශාලා
- 1931 දී සිරි දේවමිත්ත ධර්මපාල නමින් විද්‍යෝදය පිරිවෙන් භූමියේ දී පැවිදි විය
- 1933 ජනවාරි 16 උපසම්පදා වූහ
- 1933 අප්‍රේල් 29 දින *සම්බුදු සසුන බේරා ගැනීමට තවත් විසි පස් වතාවක් මේ දඹදිව ඉපදේවා* යන පැතුමෙන් අපවත් වූහ

6 පාඩම දිවිපාඩම දිවිමගට එළිය දෙන දහම් මග

- ඛුද්ධක නිකාය - ධම්මපදය
    - වර්ග 26 යි
    - ගාථා 423 යි
    - නිදාන කතා 299 යි

- **යමක වග්ගයේ 3 ගාථාව**

අක්කොච්ඡි මං අවධි මං- අජිනි මං අහාසි මේ
යේ තං උපනය්හන්ති- වේරං තේසං න සම්මති

අසවලා මට බැන්නේය මට පහර දුන්නේය මා පැරදවූයේය මා සතු දේ පැහැර ගත්තේ ය යනුවෙන් යම් අය නැවත නැවතත් සිතමින් වෛර බඳී නම් ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ

- **යමක වග්ගයේ 9 ගාථාව**

අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මේ
යේ තං න උපනයිහන්ති - වේරං තේසූපසම්මති

අසවලා මට බැන්නේ ය මට පහර දුන්නේ ය මා පැරදවූයේය මා සතු දේ පැහැර ගත්තේ යනුවෙන් යම් අය නැවත නැවතත් සිතමින් ක්‍රෝධ ගොබදින්නේ නම් ඔවුන්ගේ වෛරය සංසිඳේ

- **බාල වග්ගයේ 8 ගාථාව**

නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති

යස්ස අස්සුමුඛෝරෝදං -විපාකං පටිසේවති

යමක් යම් ක්‍රියාවක් කිරීමෙන් පසු තැවෙන්නට සිදුවේද යමක යම් ක්‍රියාවක විපාකය කඳුළු පිරි මුහුණින් යුතුව අඬමින් විඳින්නට සිදු වේද එබඳු දේ නොකිරීම යහපත් ය

- **බාල වග්ගයේ 9 ගාථාව**

තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති

යස්ස පතීතො සුමනෝ - විපාකං පටිසේවති

යමක් කිරීමෙන් පසු තැවෙන්නට සිදු නොවේද යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විඳිය හැකි වේද එබඳු ක්‍රියා වල නිරත විය යුතුය

- **යමක වග්ගයේ 3 ගාථාව**

අත්තානං ච කතං පාපං- අත්තනා සංකිලිස්සති

අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති

සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ

යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේය යමකු පව් නොකලොත් එයින් ඔහුම පිරිසිදු වන්නේ ය පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහි ම ය එක් අයකුට තවත් අයකු පිරිසිදු කළ නොහැකිය

- **අත්ත වග්ගයේ 7 ගාථාව**

සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානිච

යේ හිතං ච සාධුංච - තං වේ පරම දුක්කරං

තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසුය යම් දෙයක් තමා ට වැඩදායක ද යහපත පිණිස හෝ පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසුය

- **ජරා වග්ගයේ 10 ගාථාව**

අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං

ජිණ්ණ කොඤ්චාවඣායන්ති - ඛීන මච්ඡේව පල්ලලෙ

ඇතැම් අය තරුණ වයසේදී උසස් පිළිවෙත් වල ද නොහැසිර ලබාගත හැකි ධනයද නොලැබ මහළු වූ පසු මසුන් නැති දිය ගිලුනු විලක් දෙස බලා දුක් වන කොස්වා ලිහිණියා මෙන් තැවෙති

- **ජරා වග්ගය 11 ගාථාව**

අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං

සෙන්ති චාපාතිඛීණාව - පුරාණානි අනුත්ථුනං

ඇතැම් අය තරුණ වයසේ ලබාගත හැකි ධනය හෝ වෙනත් ප්‍රතිලාභයක් නොලැබ බඹසර නොහැසිර මහලු වූ පසු පෙර කරන ලද යම් යම් දේ සිහි කරමින් දුන්නෙන් මිදී ගොස් වැටුණු ඊතල මෙන් ශෝකයෙන් සුසුම්ලමින් සිටිති

- **අප්පමාද වග්ගය 4 ගාථාව**

උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ

සඤ්ඤතස්සච ධම්මජීවිනෝ - අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති

උත්සාහයෙන් ද නිවැරැදි සිහියෙන්ද යුතු නිදොස් දේ විමසා බලා කරන තැන්පත් දැහැමි දිවි පැවතුම් ඇති නොපමා වූ පුද්ගලයාගේ කීර්තිය මහාව වැඩේ

<u>7 පාඩම සීලය හා භෞතික සංවර්ධනය</u>

- **ශීලය යනු** සිත කය වචනය යන තිදොර සංවර භාවයයි
- වාචසික සංවරය - සම්මා වාචා බොරු කීම හිස් වචන කීම කේලාම් කීම පරුෂ වචන කිම ආදියෙන් වැලකීම
- කායික සංවරය - ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය ආදී ක්‍රියාවන්ගෙන් වෙන් වීමයි
- මානසික සංවරය - අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ඨිය ආදියෙන් වෙන්වීම

* පංච සීලය

- ප්‍රාණඝාතයෙන් වෙන්වීම
- සොරකම් කිරීමෙන් වෙන්වීම
- කාමය වරදවා හැසිරීමෙන් වෙන්වීම
- බොරු කීමෙන් වෙන්වීම
- සුරාපානයෙන් වෙන්වීම

✱ අටසිල්

- ප්‍රාණඝාතයෙන් වෙන්වීම
- සොරකම් කිරීමෙන් වෙන්වීම
- බ්‍රහ්ම චරියාවෙන් වෙන්වීම
- බොරු කීමෙන් වෙන්වීම
- සුරාපානයෙන් වෙන්වීම
- විකාල භෝජනයෙන් වෙන්වීම
- නැටුම් ගැයුම් වැයුම් හා මල් ගන්ධ සුවඳ විලවුන් දැරීමෙන් වෙන්වීම
- උස් අසුන් හා මහසුන් දැරීමෙන් වැළකීම

✱ ආජීව අෂ්ටමක සීලය

- ප්‍රාණඝාතයෙන් වෙන්වීම
- අදත්තාදානයෙන් වෙන්වීම
- කාමමිථ්‍යාචාරයෙන් වෙන්වීම
- මුසාවාදයෙන් වෙන්වීම
- හිස් වචන කීමෙන් වෙන්වීම
- පරුෂ වචන කීමෙන් වෙන්වීම
- කේලම් කීමෙන් වෙන්වීම

<u>8 පාඩම දියුණුවේ සහ පිරිහීමේ දොරටු</u>

✱ දියුණුව පිණිස බුදුරදුන් ව්‍යග්ගපජ්ජ සූත්‍රය දීඝ ජානු කෙළිය සිටු පුත්‍රයාට දේශනා කළහ

මෙලොව දියුණුව පිණිස වන කරුණු

❖ උට්ඨාන සම්පදාව - දැහැමිව ධනය ඉපැයීම

- උත්සාහයෙන් - උට්ඨානවීරියාධිකා
- දෑතේ මහන්සියෙන් - බහාබල පරිචිතා
- දහදිය හෙළා- සේදාවක්ඛිත්තා
- ධාර්මිකව- ධම්මිකා

➢ **අනුමත ජීවන වෘත්තීන්**

- කෘෂිකර්මාන්තය
- වෙළඳාම
- ගවයන් රැක බලා ගැනීම (සත්ව පාලනය)
- ආරක්ෂක සේවය
- රාජ්‍ය සේවය
- වෙනත් ශිල්ප කර්මාන්ත

- ආරක්ඛ සම්පදාව - උපයා ගත් ධනය ආරක්ෂා කර ගැනීම
  - රජයට අයත් වීම
  - සොරුන් විසින් පැහැරගැනීම
  - ගින්නෙන් හෝ ජලයෙන් විනාශ වීම
  - තමා ප්‍රිය නොකරන අයට අයත් වීම

ආදියෙන් ආරක්ෂා කරගත යුතුය

- කල්‍යාණ මිත්තතා - කල්‍යාණ මිතුරන් ඇසුරු කිරීම
  - වචීපරම
  - අසද්ධද්දත්ථුහර
  - අනුප්පියභාණී
  - අපායසහාය ආදී පාප මිත්‍රයන්ගෙන් වෙන්විය යුතුය
  - උපකාරක
  - සමාන සුඛ දුක්ඛ
  - අත්ථක්ඛායී
  - අනුකම්පක ආදී කල්‍යාණ මිතුරන් ඇසුරු කිරීම

- සමජීවිකතාව
  - අය වැය සමව දැන ක්‍රියාකිරීම
  - උදුම්බර ඛාදිකයෙන් වෙන්විය යුතුය
  - මරණයෙන් වෙන් වීම
  - නොකා නොබී මැරීම

- මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු 38
  - අනුවණයන් ඇසුරු නොකිරීම
  - නුවණැත්තන් ඇසුරු කිරීම
  - පිදිය යුත්තන් පිදීම
  - සුදුසු ප්‍රදේශයක වාසය කිරීම
  - පෙර කරන ලද පින් ඇති බව
  - ශීලාදී ගුණධර්මයන්හි පිහිටීම
  - බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව
  - ශිල්ප ශාස්ත්‍රය ප්‍රගුණ බව
  - විනය ගරුක බව
  - ප්‍රියමනාප වචන කතා කිරීම
  - මව්පියන්ට උපස්ථාන කිරීම
  - දරුවන්ට සංග්‍රහ කිරීම
  - භාර්යාවට සංග්‍රහ කිරීම

- නිවැරදි කාය කර්මයන්හි යෙදීම
- දන් දීම
- ඥාතීන්ට සංග්‍රහ කිරීම
- නිවැරැදි ජීවන වෘත්තිය යෙදීම
- පවෙහි නොඇලීම
- මදයට හා ප්‍රමාදයට හේතුවන මත්පැන් පානය නොකිරීම
- කුසල කර්මයන්හි අප්‍රමාද වීම
- තෙරුවන් මවුපියන් හා වැඩිහිටියන් කෙරෙහි ගෞරව කිරීම
- යටහත් පැවතුම් ඇති ව විසීම
- ලද දෙයින් සතුටුවීම
- කළගුණ දන්නා බව
- සුදුසු කාලයෙහි ධර්ම ශ්‍රවණය කිරීම
- ඉවසීම
- උත්තමයන්ගේ අවවාද පිළිගැනීම
- ශ්‍රමණයන් වහන්සේලා දැකීම
- සුදුසු කල්හි ධර්ම සාකච්ඡා පැවැත්වීම
- තාපස බ්‍රහ්ම චර්යාව
- ආර්ය සත්‍යය දැකීම
- නිවන පසක් කිරීම
- ලෝක ධර්මයන්ගෙන් ගැටෙන විට අනුකම්පා නොවීම
- ශෝක රහිත බව
- කෙලෙස් නැති බව
- නිර්භය වීම

❖පරාභව සූත්‍රයේ පිරිහීමේ දොරටු

- ධර්මයට කැමැති වීම
- අසත්පුරුෂයන් ප්‍රිය වීම
- සත්පුරුෂයන් ප්‍රිය නොකිරීම
- අසත්පුරුෂ ධර්මයට ප්‍රිය කිරීම
- නිතරම නිදන සුළු බව
- කතාවෙන්ම දවස ගෙවීම
- උත්සාහයෙන් තොර වීම
- අලසකම
- ක්‍රෝධ කරන බව
- මහලු වියට පත් මවුපියන්ට හැකියාව තිබියදීත් නොසැලකීම
- බමුණන් පැවිද්දන් හෝ වෙනත් තවුසන් බොරුවෙන් රැවටීම
- බොහෝ ධනය ආහාරපාන තිබියදීත් ඒවා හුදෙකලාව භුක්ති විදීම

- ජාතිය ධනය ගෝත්‍රය පිළිබඳ මානයෙන් උදම් වීම
- ස්ත්‍රීන් කෙරෙහි සුරාව කෙරෙහි ලොල්වීම
- වෛශ්‍යාවන් හා පර අඹුවන් කරා යෑම
- ඉක්මවා ගිය යොවුන් බව ඇති මිනිසකු ළාබාල තරුණියක සරණපාවා ගෙන ඇය කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් නොනිදා ඇය රැකීමට වෙහෙසීම
- සැපු නාස්තිකාර ස්ත්‍රියක හෝ පුරුෂයකු ආධිපත්‍යයේ තැබීම
- කුලය ඉපදුනු ධනයෙන් හීන මහත්වූ තෘෂ්ණාවෙන් යුතු අයෙකු රජකම පැතීම

__9 පාඩම බුද්දහමෙන් හෙළිවන සිතීමේ හා විමසීමේ නිදහස__

❖ **අංගුත්තර නිකායේ කාලාම සූත්‍රයෙහි සඳහන් කරුණු දහයකි**

- ආරංචි මාත්‍රයෙන්
- පරම්පරාවෙන් පැවත එන නිසා
- මෙය මෙසේ වී යැයි කට කටකථා මගින්
- අපගේ ඉගැන්වීම සමග ගැලපේ යැයි කියා
- මෙය තර්කානුකූල යැයි කියා
- න්‍යායානුකූලව යැයි කියා
- මතුපිට ස්වරූපය අනුව
- තම දෘෂ්ටිය අනුව සැසඳෙන්නේ යැයි කියා
- සුදුසු බව පෙනේ යැයි කියා
- මේ ශ්‍රමණයා අපගේ ගුරුවරයා යැයි කියා

යමක් පිළිනොගත යුතු ය

❖ **මා ෘ නි විමන්සක සූත්‍රයේ සඳහන් නිදහස් චින්තනය**

විමංසා කේන භික්ඛවේ භික්ඛුනා - පරස්ස චේතෝපරියායං

අජානන්තේන තථාගතේ - සමන්නේසනා කාතබ්බා

සම්මා සම්බුද්ධෝ වා නෝ වා - ඉති විඤ්ඤාණාය

මහණෙනි අනුන්ගේ සිත් හසර නොදන්නා විමසන සුලු භික්ෂුව විසින් සම්මා සම්බුද්ධ වේ ද නො වේ දැ යි තථාගතයන් වහන්සේ වුව ද විමසා බැලිය යුතු වේ

10 පාඩම බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සහජීවනයෙන් ක්‍රියා කරමු

❖ ප්‍රාග් බෞද්ධ ආගමික සංකල්පය කෙරෙහි බලපෑ බෞද්ධ ආභාෂය

- වෘක්ෂ වන්දනය වෙනුවට බෝධි වන්දනය
- මළවුන් ඇදහීම වෙනුවට මියගිය ඥාතීන්ට පින්දීම
- දෙවියන් ඇදහීම වෙනුවට දෙවියන්ට පින්දීම
- පර්වත වන්දනය වෙනුවට ස්තූප වන්දනය
- දෙවියන් පිළිම වෙනුවට බුදු රදුන් වන්දනා කිරීම
- ගමයි පන්සලයි වැවයි දාගැබයි යන සංකල්පය පැමිණීම
- සිගාලෝවාද සූත්‍රයේ සඳහන් දානය ප්‍රිය වචනය අර්ථ චර්යාව සමානාත්මතාවය ආදී සමාජගතවීම
- මෙත්තා කරුණා මුදිතා උපේක්ඛා යන විවරණයන් යුක්ත වීම

11 පාඩම පුද්ගල විෂමතා සහ කර්මය

චේතනාහං භික්ඛවේ කම්මං වදාමි
චේතයිත්වා කම්මං කරෝති
කායේන වාචාය මනසා

මහණෙනි මම චේතනාව කර්මය යැයි කියමි සිතින් සිතා කයෙන් වචනයෙන් මනසින් කර්ම සිදු කරයි

කර්මය ප්‍රධාන කොටස් දෙකකි

- කුසල කර්ම
- අකුසල කර්ම

කුසල කර්ම **චූල්ලකම්මවිභංග සූත්‍රය** විෂමතා දහහතරක් දක්වයි

- අඩු ආයුෂ ඇති අය
- දීර්ඝායුෂ ඇති අය
- බොහෝ ආබාධ ඇති අය
- අල්ප ආබාධ ඇති අය
- අවලස්සන අය
- ලස්සන අය
- යසස් නැති අය
- යසස් ඇති අය
- අල්ප භෝග ඇති අය (අප්පභෝගා)
- මහත් වූ භෝග ඇති පොහොසත් අය (මහා භෝගා)
- පහත් යැයි සම්මත අය (නීච කුලීනා)
- උසස් යැයි සම්මත අය ( )

- නුවණින් අඩු (දුප්පඤ්ඤා)
- නුවණින් යුත් අය පඤ්ඤාවන්තා)

බුදුරජාණන් වහන්සේ සුබ මාණවකයාට දේශනා කරන ලද්දේ
මාණවකය සත්වයෝ කර්මය ස්වකිය කොට ඇත්තාහ කර්මය දායාද කොට ඇත්තාහ කර්මය කරණකොට ඇත්තාහ කර්මය නෑදෑ කොට ඇත්තාහ කර්මය පිළිසරණ කොට ඇත්තාහ කර්මය නිසා මේ පුද්ගලයන්ගේ හීන බව හා උසස් බව ඇති වේ

<u>12 පාඩම සසර දුකක් දුකින් මිදී මෙන් උගන්වන බෞද්ධ හේතු ඵල ධර්මය</u>

යමෙක් පටිච්චසමුප්පාදය නුවණැසින් දකියිද
හෙතෙම ධර්මය නුවණැසින් දකී
යමෙක් ධර්මය නුවණැසින් දකියිද
හෙතෙම පටිච්ච සමුප්පාදය නුවණින් දකියි

අස්සජි හිමි උපතිස්ස පිරිවැජියාට දේශනා කරන ලද්දේ
හේතු ප්‍රත්‍ය ඇතිකළ වන්නා වූ ධර්මයෝ හේතු ප්‍රත්‍ය නැතිකළ නැති වෙත් යන මෙකී දහම බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනු ලැබේ

ඉමස්මිං සති ඉදං හෝති
ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති
ඉමස්මිං අසති ඉදං න හෝති
ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ජති

මෙය ඇති කල්හි මෙය ඇතිවේ
මෙය හට ගැනීමෙන් මෙය හට ගනියි
මෙය නැති කල්හි මෙය ඇති නොවේ
මෙය නැති වීමෙන් මෙය නැති වෙයි

✱ **අනුලෝම පටිච්ච සමුප්පාදයෙන් සසර දුක් ඇතිවන ආකාරය**

- **අවිජ්ජා පච්චයා සංඛාරා-** චතුරාර්ය සත්‍යය නොදැනීම හේතුකොටගෙන කුසලා කුසලාකුසල කර්ම රැස් කරයි
- **සංඛාර පච්චයා විඤ්ඤාණ-** කුසලාකුසල කර්ම රැස් කිරීම හේතුකොටගෙන ප්‍රතිසන්ධි සිත පහළ වේ
- **විඤ්ඤාණ පච්චයා නාම රූපං** -ප්‍රතිසන්ධි සිත හේතුකොටගෙන රූප වේදනා ආදී පංච ස්කන්ධයක් ඇති වෙයි
- **නාමරූප පච්චයා සළායතනං-** නාමරූප හෙවත් පංචස්කන්ධය හේතුකොටගෙන ඇස කන නාසය දිව ශරීරය මනස යන ආයතන පහළ වේ
- **සළායතන පච්චයා ඵස්සෝ** - සළායතන හේතුකොටගෙන ස්පර්ශය ඇතිවේ වේදනා ස්පර්ශය හේතු කොට ගෙන සුඛ දුක්ඛ උපේක්ඛා වේදනා පහළ වේ
  වේදනා පච්චයා තණ්හා - වේදනා හේතු කොට ගෙන තණ්හාව ඇතිවේ

- **තණ්හා පච්චයා උපාදානං** - තණ්හාව නිසා සිතින් දැඩිව අල්ලා ගැනේ ස්වභාවය බව සිතින් දැඩිව අල්ලා ගැනීම නිසා නැවත භවයට එකතුවේ
- **භව පච්චයා ජාති** - නැවත එකතු වීම නිසා සසර ඉපදීම සිදුවේ
- **ජාති පච්චයා ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති** - ඉපදීම නිසා ජරා මරණ ශෝක පරිදේව දුක්ඛ දෝමනස්ස ආදී සියලු දුක් හට ගනී

✸පටිලෝම පටිච්ච සමුප්පාදයෙන් සසර දුක් නැති වන ආකාරය

- **අවිද්‍යාවත්වේව අසේස විරාග නිරෝධා සංඛාර නිරෝධෝ** - අවිද්‍යාව ඉතිරි නොකොට සපුරා කිරීමෙන් කුසලාකුසල කර්ම රැස් නොවේ
- **සංඛාර නිරෝධ විඤ්ඤාණ නිරෝධෝ** - කුසලාකුසල කර්ම රැස් නොකිරීමෙන් ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් ඇති නොවේ
- **විඤ්ඤාණ නිරෝධා නාම රූප නිරෝධෝ** - ප්‍රතිසන්ධිය ඇති නොවීමෙන් නාම රූප පහළ නොවේ
- **නාම රූප නිරෝධා නාම රූප නිරෝධෝ** - නාමරූප හෙවත් පංචස්කන්ධය පහළ නොවීමෙන් ඇස කන නාසය දිව ශරීරය මනස ආදී ආයතන සය පහළ නොවේ
- **සළායතන නිරෝධ ඵස්ස නිරෝධෝ** - සලායතන පහළ නොවීමෙන් ස්පර්ශය ඇති නොවේ
- **ඵස්ස නිරෝධ වේදනා නිරෝධෝ** - ස්පර්ශය පහල නොවීමෙන් සුඛ දුක්ඛ උපේක්ඛා ආදී වේදනා පහළ නොවේ
- **වේදනා නිරෝධ තණ්හා නිරෝධෝ** - වේදනා නොමැති වීමෙන් තණ්හාව නැති වේ
- **තණ්හා නිරෝධ උපාදානං නිරෝධෝ** - තණ්හාව නැති වීමෙන් සිත දැඩිව අල්ලා ගැනීමක් සිදුනොවේ
- **උපාදාන නිරෝධ භව නිරෝධෝ** - සිතින් දැඩිව අල්ලා නොගැනීම නිසා නැවත නැවත භවයක එකතු නොවේ
- **භව නිරෝධා ජාති නිරෝධෝ** - නැවත එකතු වීම නිසා ජාති ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දොමනස්සුපායාසා නිරුප්පත්ති ජාතියක් හෙවත් උපතක් සිදු නොවන බැවින් ජරා මරණ ශෝක පරිදේව දුක්ඛ දෝමනස්ස ආදී සියලු දුක් නිරුද්ධ වේ

✸ සමාජ ගැටලු ඇතිවන ආකාරය චක්කවත්ති සීහනාද සූත්‍රයෙහි පටිච්චසමුප්පාදය දක්වා ඇත්තේ

මහණෙනි දිළින්දන්ට ධනය ලැබීමේ දිළිදුකම නැති වේ දිළිඳුකම නැති විට සොරකම නැති වේ දිළිඳුකම නැති විට සොරකම නැති වේ සොරකම නැති විට ආයුධ අවශ්‍ය නොවේ අවි ආයුධ නැති විට ප්‍රාණඝාතය සිදු නොවේ ප්‍රාණඝාතය නැති විට බොරුව කේළම නැති වේ බොරු කේලාම් කීම නැති විට අනිසි කාමසේවනය නැති වේ අනිසි කාමසේවනය නැති විට රළු වචන හිස් වචන නැතිව රළු වචන නැති විට මිථ්‍යාදෘෂ්ටිය නැති වේ මිථ්‍යා දෘෂ්ටිය නැති විට අධර්මය ඇලීමත් විෂම ලෝභය හා මිථ්‍යා ධර්මය නැති වේ ධර්මයෙහි ඇලීම විෂම ලෝභය මිථ්‍යා ධර්මය නැති විට මව්පියන්ට ගරු කරන පැවිද්දන්ට සලකන කුලදෙටුවන් දැහැමි සමාජයක් ඇති වේ

* මහා නිදාන සූත්‍රය තණ්හා මුල්කොට සමාජය කෝලාහල ඇති වන අයුරු පටිච්චසමුප්පාදයට අනුව පෙන්වා දී ඇත්තේ

වේදනාව නිසා තණ්හාව ඇතිවේ තණ්හාව නිසා රූපය අරමුණු සොයයි සෙවීම නිසා ලැබීම සිදුවේ ලැබීම නිසා හොඳ නරක විනිශ්චය කරයි එනිසා ඡන්දරාගය ඇති ඡන්දරාගය නිසා මමත්වය ඇතිවේ මමත්වය නිසා මසුරුකම ඇතිවේ මසුරුකම නිසා ආරක්ෂා කිරීම ඇතිවේ ආරක්ෂා කිරීම නිසා දඬු මුගුරු දැරීම අවි දැරීම කෝලහාල ආවේග ඇනුම් බැනුම් කේලම් බොරුකීම ආදී නොයෙක් ළාමක අකුසල කර්මය ඇතිවෙති

<u>14 පාඩම පරිසර හිතකාමී වෙමු</u>

*** බුදු දහම තුළ පරිසර සංරක්ෂණය**

- භික්ෂුන්ට පරිහරණය කරන ජලයට කෙළ ගැසීම මළ මුත්‍ර කිරීම වමනය කිරීම නොකළ යුතුය
- ජලය පෙරා පානය කිරීම අනුදැන වදාළහ
- හිල් තණ කොළ මතට කුණුරොඩු ඉඳුල් ආදිය දැමීම තහනම් කිරීම
- පලතුරු උයන් වැවීම ස්වභාවික වනාන්තර මැවීම ඒදඬු පාලම් පන්සල් පොකුණු ආදිය තැනීම දිවා රාත්‍රී පින් වැඩ ක්‍රියා ලෙස දැක්වීම
- බුදුන් වහන්සේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ දෙස දෙස සතියක් ඇසිපිය නොහෙළා බලා සිටීම

<u>15 පාඩම බුදුබණ ඇසුරෙන් නීරෝගී දිවියක්</u>

- ආරෝග්‍යා පරමා ලාභා පරමාලාභා නිරෝගි බව උතුම්ම ලාභයයි
- දන්දීම ආයුෂ වර්ණ සැප බල ප්‍රඥා ආදී දියුණු වීම
- භාවනා කිරීම මගින් මානසික නිරෝගි බව ඇති කරගත හැක
- සසර දුකට පිළියම් කළ බැවින් භට වන බව දුකට වෙදාණන් යනුවෙන් දක්වයි
- නිරෝගී ජීවිත යහපත් පරිසරයද අවශ්‍ය වේ
  - * හිල් තණකොළ මත මළ මුත්‍රා බැහැර කිරීම තහනම් කිරීම
  - * කුණු දැමීම තහනම් කිරීම
  - * ඉඳුල් හප ඇට ආදිය දැමීම තහනම් කිරීම
- භික්ෂුන්ගේ ආවාස කුටි පිරිසුදුව පවත්වාගෙන යා යුතු ආකාරය පිළිබඳ උපදෙස් උපදෙස් රාශියක් චුල්ලවග්ගපාළියේ වත්ත ඛණ්ඩයේ දක්වා තිබේ
- ආහාර මත්තඤ්ඤුතා ආහාරයෙහි ප්‍රමාණය දැන ආහාර ගත යුතුය

- භද්දාලි සූත්‍රයෙන් පමණ දැන ආහාර ගැනීම දක්වා ඇති ප්‍රතිඵල
    * රෝගාබාධ අඩු බව
    * නිදුක් බව
    * සැහැල්ලු පැවැත්ම
    * කාය බලය
    * සුවපහසු පැවැත්ම
- භික්ෂූන්ගේ නිරෝගිකම සඳහා සක්මන් මළුවක් අනුදැන වදාළහ
- කොසොල් රජුට ආහාර ගැනීමට උපදෙස් දීම

<u>16 පාඩම</u> <u>නිමල දහම රැකුණු අයුරු</u>

ආනන්ද මගේ ඇවෑමෙන් ධර්මය වෙන ශාස්තෘවරයන් වන්නේය

	ප්‍රථම ධර්ම සංගායනාව	දෙවන ධර්ම සංගායනාව	තෙවන ධර්ම සංගායනාව	සිව්වන ධර්ම සංගායනාව
බුද්ධ පරිනිර්වාණයෙන්	තෙමසකට පසු	වසර සියයකට පසු	වසර 236 කට පසු	ක්‍රිස්තු පූර්ව පළමු වන සියවසේ
ප්‍රධාන හේතුව	සුභද්‍ර භික්ෂුවගෙ නුසුදුසු වචනය	වජ්ජිපුත්තක භික්ෂූන්ගේ අකැප දස වස්තුව	ලාභාපේක්ෂාවෙන් දුසිල් භික්ෂූන් සසුන්ගතවීම	ත්‍රිපිටකධාරී මහ තෙරුන් වහන්සේලා හා ධර්මය විනාශ වීමේ අවදානම
මූලිකත්වය	මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ	සබ්බකාමී මහරහතන් වහන්සේ	තිස්ස මහරහතන් වහන්සේ	-
දායකත්වය	අජාසත්ත රජු	කාලාශෝක රජු	ධර්මාශෝක රජු	ප්‍රාදේශීය නායකයෙකු
ස්ථානය	රජගහනුවර වේභාර පර්වතය පාමුළ සප්තපර්ණී ගුහා ද්වාරය අබියස	විශාලාමහනුවර වාලුකාරාමය	පැළලුප් නුවර අශෝකාරාමයේ	මාතලේ අලුවිහාරය
සහාය වූ පිරිස	ආනන්ද උපාලි තෙරුන් වහන්සේලා	රේවත, සබ්බකාමී, යස, සාළ්හ, ඛුජ්ජිසෝභිත, වසභගාමී ,සුමන, සාණවාසී ,සම්භූත	මහින්ද , මහා රක්ඛිත, මහා දේව තෙරුන් වහන්සේලා	පැහැදිලි නැත

		තෙරුන් වහන්සේලා		
ගතවූ කාලය	මාස 7	මාස 8	මාස 9	
සහභාගිවූ ප්‍රමාණය හා සංගායනාව හැඳින්වන නාමය	500 පංච සතිකා සංගීතිය	700 සත්තසතිකා සංගීතිය	1000 සහස්සිකා සංගීතිය	500 පුස්තකාරූඪ සංගීතිය
ප්‍රතිඵල	විසිරී තිබූ ධර්ම විනය එක්රැස් කර සම්මුතියකට ගෙන ඒම ධර්ම විනය කොටස් කර භාණක පරපුරට පැවරීම නව විනය නීතිය නො පැමිණීමටත් පැනවූ විනය නීති ආරක්ෂා කිරීමටත් ප්‍රතිඥා දීම	විනය විරෝධී කටයුතු කළ භික්ෂූන්ට නිග්‍රහ කිරීම දසවස්තුව ප්‍රතික්ෂේප කිරීම පළමු සංගීතියේ දී ඇති කරගත් සම්මුතිය අනුව ශික්ෂා පද ලිහිල් නොකර ඉදිරියට පවත්වාගෙන යෑම අටලොස් නිකාය බිහිවීම	දුසිල් මහණුන් හැටදාහක් සුදුවත් අන්දවා සසුනෙන් නෙරපා හැරීම ශාසනික පිළිවෙත් නැවත ආරම්භ කිරීම කථාවත්ථුප්පකරණය ඇතුලත් කර අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම ත්‍රිපිටකයේ ම අංග සම්පූර්ණ වීම දේශීය විදේශීය ධර්ම ප්‍රචාරය	ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

* ## ප්‍රථම ධර්ම සංගායනාව

සුභද්‍ර භික්ෂුවගෙ දුර්වචනය
"ඇවැත්නි ශෝක නොකරවු නොහඬවු නොවැලපෙවු ඒ මහා ශ්‍රමණයාගෙන් මැනවින් මිදුණෝ වෙමු "

සූත්‍රධර්ම නිකාය වශයෙන්	භාණක පරපුර
දීඝනිකාය	ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව
මජ්ඣිම නිකාය	සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව
අංගුත්තර නිකාය	අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව
සංයුක්ත නිකාය	මහා කාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව
ඛුද්දක නිකාය	සියලුම භික්ෂූන් වහන්සේලාට

- දීඝ නිකාය - දීර්ඝ සූත්‍ර
- මජ්ඣිම නිකාය - මධ්‍යම ප්‍රමාණ වූ සූත්‍ර
- අංගුත්තර නිකාය - සංඛ්‍යාත්මක ව අංකයෙන් අංකයට ධර්ම කරුණු වැඩිවන සේ කරුණු ඇතුළත් සූත්‍ර
- සංයුත්ත නිකාය - එකිනෙකට ගෙතූ ධර්ම කරුණු ඇතුළත් සූත්‍ර
- ඛුද්දකනිකාය - කුඩා ප්‍රමාණයේ සූත්‍ර ඇතුළත්

❖ **විනය පිටකය**

- පාරාජිකා පාළි } උපසම්පදා භික්ෂූන්ට අදාළ විනය ශික්ෂා පද
- පාචිත්තිය පාළි
- චුල්ල වග්ග පාළි
- මහා වග්ග පාළි

} සංඝ සමාජයේ පැවැත්මට අවැසි දෑ

- පරිවාර පාළි

- **තෙවන ධර්ම සංගායනාව**
  සූත්‍ර විනය අභිධර්මය යන ත්‍රිපිටකය සංගායනා කිරීම

පරවාද මත පන්සියයක් මර්ධනය කොට කථාවත්ථුප්පකරණය මොග්ගලිපුත්ත මොග්ගලිපුත්ත තිස්ස හිමි විසින් රචනා කිරීම

❖ **අභිධර්මපිටකය**

- ධම්මසංගණිප්පකරණය
- විභංගප්පකරණය
- ධාතුකථාප්පකරණය
- පුද්ගලපඤ්ඤත්තිප්පකරණය
- කථාවත්ථුප්පකරණය
- යමකප්පකරණය
- පට්ඨානප්පකරණය

	ප්‍රදේශය	නායකත්වය	ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය හෝ කථා වස්තුව
1	කාශ්මීර	ගන්ධාර තෙරුන් වහන්සේ	ආසිවිසෝපම සූත්‍රය
2	මහිස මණ්ඩලය	මහාදේව තෙරුන් වහන්සේ	දේවදූත සූත්‍රය
3	වනවාසී දේශය	රක්ඛිත තෙරුන් වහන්සේ	අනමතග්ග සංයුත්තය
4	අපරාන්ත දේශය	යෝනක ධම්මරක්ඛිත තෙරුන් වහන්සේ	අග්ගික්ඛන්ධෝපම සූත්‍රය
5	මහා රට්ඨ	මහා ධම්මරක්ඛිත තෙරුන් වහන්සේ	මහා නාරද කස්සප ජාතකය
6	යෝනක රට්ඨ	මහාරක්ඛිත තෙරුන්	කාලකාරාම සූත්‍රය

		වහන්සේ	
7	හිමවන්ත ප්‍රදේශය	මජ්ඣිම තෙරුන් වහන්සේ	ධම්මචක්කප්පවත්තන සූත්‍රය
8	සරණ භූමිය	සෝණ උත්තර යන තෙරුන් වහන්සේලා	බ්‍රහ්මජාල සූත්‍රය
9	තම්බපණ්ණි ශ්‍රී ලංකාව	මිහිඳු මහරහතන් වහන්සේ	චුල්ලහත්ථි පදෝපම සූත්‍රය

- නව රට සසුන් පිහිටුවීම

❖ **අලුවිහාර සංගායනාව**

ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
ලෝකයේ බොහෝ රටවල මෙම ග්‍රන්ථ පසු කාලයේ උපකාලයේ උපයෝගී කොට ගෙන බෙදා හරිනු ලැබීය

17 පාඩම මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකික ජන ජීවිතයේ ඔපවත් වූ ආකාරය

- බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසු මිහිඳු හිමි මෙරටට වැඩීමවීය
- ප්‍රථම ආරාම පූජාව වූ මහමෙව්නා උයනෙහි මහා විහාරය ආරම්භ කිරීම
- මග අරිට්ඨ කුමරු ඇතුළු පන්සියයක් පිරිස පැවිදි කොට මෙරට භික්ෂු සාසනය ආරම්භ කිරීම
- බෞද්ධ අවසාන ක්‍රමය ආරම්භ කිරීම
- සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය රැගෙන මෙරටට වැඩමවීම
- අනුලා බිසව ඇතුළු කාන්තාවන් පැවිදි කොට භික්ෂුණී ශාසනය පිහිටුවීම
- චිත්‍ර මූර්ති කැටයම් ගෘහ නිර්මාණ ශිල්පය මෙරටට ලැබීමත් බ්‍රාහ්මී අක්ෂර කලාවක් ලැබීම දහමින් පෝෂණය වූ වන්දනා හා චාරිත්‍ර ක්‍රම ලැබීම

18 පාඩම හෙළ බොදු කලාවේ අසිරිය

✱ <u>බුදු පිළිම වර්ග</u>

- හිඳි පිළිම- අනුරාධපුරයේ සමාධි පිළිමය, තොලුවිල සමාධි බුද්ධ ප්‍රතිමාව
- හිටි පිළිම -අවුකන බුද්ධ ප්‍රතිමාව, ගල් විහාර හිටි පිළිමය
- සැතපෙන පිළිම- ගල් විහාරයේ සැතපෙන පිළිමය

✱ <u>මුද්‍රා</u>

- ධ්‍යාන මුද්‍රාව
- විතර්ක මුද්‍රාව
- ධර්ම චක්‍ර මුද්‍රාව
- භූමි ස්පර්ශ මුද්‍රාව
- වරද මුද්‍රාව

* <u>බුදු පිළිමවල ආසන</u>
    - වීරාසනය
    - භද්‍රාසන
    - පද්මාසනය

* ප්‍රතිමාඝර
    - ගන්ධකුටි- කිරිබත්වෙහෙර, තොලුවිල, පන්කුලිය යන ස්ථානවල දැකිය හැක
    - පාසද- මග සහිත ගොඩනැගිල්ලකි .රත්නප්‍රසාදය, බිසෝ මාලිගාව ගොඩනැගිල්ල
    - ගෙඩිගේ - සියල්ල ගඩොලින් නිමවා ඇත. ථූපාරාම පිළිමගේ , තිවංක පිළිමගේ ,ලංකාතිලක පිළිමගේ, නාලන්දා ගෙඩිගේ

* **චිත්‍ර කලාව**
    - මහනුවර යුගයේ චිත්‍ර - දෙගල්දොරුව විහාරය, බඹරගල විහාරය, මැදවෙල විහාරය, රන්ගිරිදඹුලු විහරය, රිදී විහාරය ,කැලණියේ පැරණි විහාර මන්දිරය
    - දෙවරගම්පල සිල්වත් තැන හිරියාල නයිදේ දේවේන්ද්‍ර මූලාචාරියා රේඛා කර්මය හා වර්ණ පූර්ණය යන අංග වලින් සිදු කර ඇත

* නූතන යුගයේ චිත්‍ර කලාව
    - 19 වන සියවසේ අග භාගයේ සහ 20 වන සියවසේ ආරම්භක වකවානුව චිත්‍ර කර්මාන්තය
    - ජිවඩ් හෙන්රික්සන් ශූන්ඩිපාස් ගි ජයතිලකාරාමය අඳින ලද සිතුවම්
    - එම් .එම්. සාර්ලිස් - කොළඹ මාලිගාකන්ද විහාරයේ අශෝකාරාමය, ඉසිපතනාරාමය ,වේළුවනාරාමය , පොතුපිටියේ පූජා ආරාමයේ ඇත
    - 1930 සෝලියස් මැන්දිස් - කැලණිය අලුත් විහාර මන්දිරය, මාවිල සුමන කුසුමාරාමය, රණස්ගල්ල විහාරය, මැද්දේයාල විහාරය
    - ජෝර්ජ් කීට් - බොරැල්ල ගෝතමී විහාරයේ අඳින සිතුවම්
    - ඇල්බට් ධර්මසිරි - සේදවත්ත වෙහෙරගොඩැල්ල විහාරයේ අඳින සිතුවම්
    - සෝමබන්දු විද්‍යාර්ථී - බෙල්ලන්විල රජමහා විහාරයේ සිතුවම්

* බෞද්ධ චිත්‍ර කලාවේ අරමුණු
    - හොඳ සාරධර්ම ජනතාව අතරට ගෙන යාම
    - ධාර්මික විනෝදාස්වාදයක් ලබා දීම
    - සංස්කෘතික ප්‍රෞඩත්වය හෙලිකිරීම
    - දිගුකාලින ඉතිහාසයකට උරුමකම් කී ජාතියක් බව විදහා පෑම
    - දෙස් විදෙස් සංචාරක ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය ඇති වීම

19 පාඩම බුදු සමයේ පෝෂණය වූ සිංහල සාහිත්‍ය

ග්‍රන්ථය	විෂය පථය	කතුවරයා	යුගය
පූජාවලිය	අරහං බුදුගුණය	බුද්ධපුත්‍ර හිමි	දඹදෙණි යුගය
සද්ධර්මරත්නාවලිය	ධම්මපදට්ඨ කථා පුවත්	ධර්මසේන හිමි	දඹදෙණිය යුගය
සිදත් සඟරාව	සිංහල ව්‍යාකරණ	පතිරාජ පරිවෙනාධිපති වේදේහ හිමි	දඹදෙණි යුගය
සද්ධර්මාලංකාරය	ධම්ම කථාවස්තු	ධර්මසේන හිමි	දඹදෙණිය යුගය
පියුම් මල් හමැති නිඝණ්ටුව	-	-	දඹදෙණිය යුගය
එළු සඳැස් ලකුණ	-	-	දඹදෙණිය යුගය
පන්සිය පනස් ජාතකය	බෝසත් චරිතය	-	කුරුණෑගල යුගය
සිංහල බෝධිවංශය	ශ්‍රී මහා බෝධිය පිළිබඳ විස්තර	-	කුරුණෑගල යුගය
ථූපවංශය	රුවන්වැලි මහා සෑ පිළිබඳ	-	කුරුණෑගල යුගය
මයුර සංදේශය	මොණරෙකු ගැන උපුල්වන් දෙවියන් ට යාතු පණිවිඩයකි	විද්‍යා චක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිත	ගම්පොළ යුගය
තිසර සන්දේශය	-	-	ගම්පොළ යුගය
නිකාය සංග්‍රහය (ශාසනාවතාරය)	-	ධර්මකීර්ති හිමි	ගම්පොළ යුගය
එළු අත්තනගලු වංශය	-	-	ගම්පොළ යුගය
සද්ධර්මාලංකාරය	-	-	ගම්පොළ යුගය
සැළලිහිණි සංදේශය		රාහුල හිමි	කෝට්ටේ යුගය
පරවි සංදේශය		රාහුල හිමි	කෝට්ටේ යුගය
කාව්‍යශේඛරය		රාහුල හිමි	කෝට්ටේ යුගය
පංචිකා ප්‍රදීපය		රාහුල හිමි	කෝට්ටේ යුගය
බුද්ධිප්පසාදිකාව		රාහුල හිමි	කෝට්ටේ යුගය
ලෝවැඩ සඟරාව		විදාගම හිමි	කෝට්ටේ යුගය
බුදුගුණඅලංකාරය		විදාගම මෛත්‍රී හිමි	කෝට්ටේ යුගය

20 පාඩම දැහැමි ධනය ගෙනෙයි සැපය

* නිවැරදි කර්මාන්ත
- කෘෂිකර්මාන්තය (කසී)
- වෙළඳාම (වාණිජ්ජා)
- ගවයන් රැක බලා ගැනීම (ගෝ රක්ඛ)
- රාජ්‍ය සේවය (රාජ පෝරිස)
- අනෙකුත් ශිල්ප කර්මාන්ත (සිප්පඤ්ඤතර)

* වෙළඳාමේදී අත්හළ යුතු පිළිවෙත්
- හොරට කිරීම - තුලා කූට
- හොරට මැනීම- මාන කූට
- බාල දේ අගය කර විකිණීම - කංස කූට

* නොකළ යුතු වෙළඳාම්
- අවි ආයුධ වෙළඳාම
- සත්ත්ව වෙළෙඳාම
- මස් වෙළෙඳාම
- වස විස වෙළඳාම
- මත්ද්‍රව්‍ය වෙළෙඳාම

* අණන සූත්‍රයේ සඳහන් දැහැමි ධනය ලැබිය හැකි සුඛ සංකල්පය
- අත්ථි සුඛය - දැහැමින් උපයාගත් ධනය ඇතැයි සිතා සතුටු වීම
- භෝග සුඛය - උපයාගත් ධනය දැහැමිව පරිහරණය කිරීමෙන් ලබන සැපය
- අණන සුඛය - කිසිවෙකුටත් ණය නොවීමෙන් ලබන සැපය
- අනවජ්ජ සුඛය- නිවැරැදි දිවි පෙවතක් ගත කිරීම තුළින් ලබන සතුට

* ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් මෙලොව දියුණුව පිණිස වන කරුණු
- උට්ඨාන සම්පදා
- ආරක්ඛ සම්පදා
- කලයාණ මිත්තතා
- සමජිවිකතා

21 පාඩම දැහැමිව උපයා දැහැමිව වැය කරමු

* පත්තකම්ම සූත්‍රයේ සඳහන් ධනය පරිහරණය කළ යුතු ආකාර4 කි
- තමාගේ මව් පියන්ගේ අඹුදරුවන්ගේ හා සේවක සේවකයන්ගේ වෙනුවෙන්
- ධනය ගින්නෙන් ජලයෙන් සොර සතුරන්ගෙන් හා අය බදු ගෙවීම් අය බදු ගෙවීම් වලින් ආරක්ෂා කරගැනීම

[Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!]

- ඥාති බලි - ඥාතීන්ට සංග්‍රහ කිරීම
  අතිථි බලි - ආගන්තුක සත්කාරයට යෙදවීම
- පුබ්බපේත බලි - මියගිය ඥාතීන්ට සැලකීම
  රාජ බලි - පඩි බදු ගෙවීම
  දේවතා බලි - දහම් සඳහා යෙදවීම

22 පාඩම පාලකයනට වග කියන බුදුදහම

* දස රාජ ධර්ම
  - දානය
  - ශීලය
  - පරිත්‍යාගය
  - ඍජු බව
  - මෘදු බව
  - තපස
  - අක්‍රෝධය
  - අවිහිංසාව
  - ඉවසීම
  - විරුද්ධ නොවීම
* පංචසීලය
* සිව්බඹ විවරණ
  - මෙත්තා
  - කරුණා
  - මුදිතා
  - උපේක්ඛා

23 පාඩම ලොව්තුරු සුවේ පදනම සම්මා දිට්ඨියයි

* ත්‍රිවිධ ශික්ෂා
- අධිශීල - සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව
- අධි චිත්ත - සම්මා වායාම, සම්මා සති ,සම්මා සමාධි,
- අධි ප්‍රඥා- සම්මා දිට්ඨි, සම්මා සංකප්ප

  * සච්ච විභංග සූත්‍රයට අනුව සම්මා දිට්ඨිය
- දුක පිළිබඳ ඥානය - දුක්ඛ සමුදය පිළිබඳ ශුණය, දුක්ඛ නිරෝධය පිළිබඳ ශුණය, දුක්ඛ නිරෝධ ගාමිණි ප්‍රතිපදා පිළිබඳ ඥානය

WWW.PastPapers.WiKi
[Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!]